# පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

# මූලික තොරතුරු ලේඛනය

# ඉස්ලාමීය

# කල්බදු හා ණය

මූලික තොරතුරු ලේඛනය – අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සහ වැඩිදුර තොරතුරු

පීපල්ස් ලීසිං විසින් පිරිනමන ඉස්ලාමීය නිපැයුම් හා සේවා පිළිබඳ විමසීම සඳහා පහත ක්‍රම භාවිතා කළ හැකි ය.

ඇමතුම්: +94 112 631631
විද්‍යුත් තැපැල: info@plc.lk
වෙබ් අඩවිය: https://www.plc.lk/
පැමිණ හමුවන්න: ප්‍රධාන කාර්යාලය, අංක.1161, මරදාන පාර, කොළඹ 08, ශ්‍රී ලංකාව.

සතියේ දිනවල පෙ.ව. 8.30 - ප.ව. 5.15 දක්වා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ඕනෑම ශාඛාවක් වෙත ගොස් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ඔබට හැකියාව ඇත. පහත ලැයිස්තුවෙන් ඔබට සමීපතම ශාඛාව පිළිබඳ දැනගන්න.
https://www.plc.lk/branch Locator

වැඩිදුර තොරතුරු හා විමසීම් සඳහා අපගේ සමාජ මාධ්‍ය නාලිකා නිරන්තරයෙන් සූදානම් ව සිටී.

Facebook : https://www.facebook.com/PeoplesLeasingFinancePLC,

Instagram : https://www.instagram.com/peoplesleasingandfinance,

YouTube : https://www.youtube.com/channel/UCG_bfhA3ImDP_4Wzd9GpRaA,

LinkedIn : https://www.linkedin.com/company/peoples-leasing,

Twitter : https://twitter.com/peoplesleasing,

**01.**මූලික තොරතුරු ලේඛනය- ඉජාරාහ්/ ඉස්ලාමීය කල් බදු ක්‍රමය

| | |
|---|---|
| විස්තරය හා නිපැයුමෙහි අරමුණ | විස්තරය:<br><br>ඉජාරාහ්/ ඉස්ලාමීය කල් බදු ක්‍රමය<br><br>ඉජාරාහ් යනු යම් සුවිශේෂී දේපළක පරිභෝජනය එහි හිමිකරු ( බදු හිමියා) විසින් එහි පරිභෝජකයා (බදු ගැනුම්කරුවා) ගෙන් ලබාගන්නා කුලියක් වෙනුවට වෙනත් පුද්ගලයකු වෙත මාරු කිරීම වේ.<br><br>අරමුණ :<br><br>*ලියාපදිංචි නොකළ වාහන, ලියාපදිංචි වාහන, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සඳහා ඉජාරාහ් කල් බදු පිරිනැමිය හැකි වේ. |
| පාරිභෝගිකයන් සඳහා වන ප්‍රතිලාභ | * නම්‍යශීලී ආපසුගෙවීම්<br><br>* රක්ෂණය කුලියට එකතු කිරීම / හෝ පෙර ගෙවීම කළ හැකි වේ.<br><br>* වත්කම් ආදේශ කිරීම<br><br>* පහසුකම් නැවත සැලසුම්කිරීම<br><br>* කළමනාකරණ අනුමැතියට යටත්ව බදුකරු වෙනස් කළ හැක.<br><br>*පාවෙන ලාභ අනුපාත සහිත පහසුකම් ප්‍රදානය කරන විට ප්‍රාග්ධන කොටස පියවීම |
| ඉලක්ක වෙළඳපොල | *තනිපුද්ගලයින්/ වෘත්තීයවේදීන්<br><br>*සමාගම්<br><br>*ව්‍යාපාරිකයින් |
| ප්‍රධාන නියමයන් හා කොන්දේසි | * ඉජාරාහ් යනු මූලික වශයෙන් පිරිනැමීම සහ පිළිගැනීම අවශ්‍ය වන ගිවිසුමකිපිරිනැමීම බදු දෙන්නාගෙන් හෝ . කුලීකරුගෙන් සිදු විය හැකි අතර බදුකරුගෙන් හෝ කුලියට ගැනීමෙන් හෝ අනෙක් අතට පිළිගැනීම සිදු විය හැකිය.<br><br>* අනෙකාගේ අනුමැතියකින් තොරව අනෙක් පාශර්වයට අවසන් කිරීමට හෝ වෙනස් කිරීමට නොහැකි බවින් මෙම ගිවිසුම බැඳී පවතී.<br><br>* ඉජාරාහ් වල වලංගු භාවය සඳහා, කල්බදු විෂයයට/විෂය වස්තුවට ප්‍රයෝජ්‍ය වටිනාකමක් තිබිය යුතුය. එබැවින් ප්‍රයෝජ්‍ය අගයක් රහිත කිසිවක් කල් බදු ගිවිසුමක ට යටත් කළ නොහැක.<br><br>*බදුගැනුම්කරු සන්තකයේ ඇති ඉජාරාහ් ලිපිය බදු දෙන්නා වෙනුවෙන් ඔහු ඇය/ස්වකීය භාරකාරත්වයේ රඳවා ගනී අයිතියෙන් පැන නගින සියලුම වගකීම් බදු දෙන්නා විසින් දරනු .ලබන නමුත් දේපල භාවිතය සම්බන්ධ වගකීම් බදුගැනුම්කරු විසින් දරනු ලැබේ.<br><br>අවශ්‍ය ලේඛන:<br><br>අ) ඔහුගේ / ඇයගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්.<br><br>(ආ) ආයතනයක් නම්, අධ්‍යක්ෂවරුන්ගේ ජාතික හැඳුනුම්පත්වල පිටපත්, සංගමයේ ව්‍යවස්ථා, 40, 41 හා 20 දරන ආකෘති පත්‍ර සහ සමාගමක් සම්බන්ධයෙන් වන විට IFSU හි ඉජාරාහ් පහසුකමක් ඉල්ලා සිටීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අභියෝජනාව.<br>(ඇ) පදිංචි ලිපිනය තහවුරු කිරීම සඳහා බිල්පත් වැනි ලේඛනමය සාක්ෂි. |

| | |
|---|---|
| | (ඇ) චංචල දේපළ සම්බන්ධ ව මෑතක දී ලබා ගත් තක්සේරු වාතර්ාව.<br><br>(ඉ) සේවා නියුක්තිකයකු නම්, වැටුප් විස්තර, අඩු කිරීම්, ශුද්ධ වැටුප හා විශ්‍රාම දිනය තහවුරු කරමින් සේවා යෝජකයාගෙන් ලබා ගත් ලිපියක්.<br><br>(ඊ) ආදායම තහවුරු කිරීම සඳහා උපස්ථම්භක ලේඛන (බැංකු ප්‍රකාශ, විගණනය කළ හා කළමනාකරණ ගිණුම්).<br><br>(උ) බදු ගෙවන්නෙකු නම්, බදු ලිපිගොනු අංකය සහ පසුගිය අවුරුදු 3 ක ගෙවීම් ලදුපත්.<br><br>(ඌ) සංගමයක් / සමාජයක් /සංසදයක් සම්බන්ධයෙන් වන විට IFSU හි ඉජාරාහ් පහසුකමක් ඉල්ලා සිටීම සඳහා ව්‍යවස්ථාවේ පිටපත් සහ කළමනාකරණ මණ්ඩලයේ අභියෝජනාව<br><br>(එ) භාරයක් සම්බන්ධයෙන් වන විට, IFSU හි ඉජාරාහ් පහසුකමක් ඉල්ලා සිටීම සඳහා භාර ඔප්පුවේ පිටපත් සහ භාරකාර මණ්ඩලයේ/මහා භාරකරුගේ අභියෝජනාව<br><br>(ඒ) නිසි පාරිභෝගික තොරතුරු (CDD) අවශ්‍යතා සම්පූණර් කිරීම |
| නෛතික ප්‍රතිපාදන | 2000 අංක 56 දරන මුල්‍යා කල්බදු පනත |
| අනුපාතය | පාරිභෝගික අවදානම් පැතිකඩ මත පදනම් වන ලාභ අනුපාත 16% සිට 32 % දක්වා පරාසයක පවතී. |
| ගාස්තු හා අයකිරීම් | * ලේඛන ගාස්තු(තැපැල්- රුපියල් 2000/-3750/-, ණය තොරතුරු කාර්යාංශය- රුපියල් 750/- 2,500/-,පරීක්ෂණ- රුපියල් 3000/- 4500/-, මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ අතිරේකය රුපියල් 470)<br><br>* මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු - රජය විසින් පනවන ලද නියමිත ගාස්තු<br><br>* රක්ෂණ ගාස්තු<br><br>* අය විය යුතු සමස්තයෙන් 1% ක මුද්දර ගාස්තු<br><br>• ගෙවීම් පැහැර හැරීම් මත ගණනය කෙරෙන 24% වාෂර්ික අඛණ්ඩ ගාස්තු |

- පාරිභෝගික පැමිණිලි සම්බන්ධ කටයුතු සඳහා කරුණාකර මෙම ලේඛනයෙහි අවසාන පිටුව වෙත යොමුවන්න.

**02.** මූලික තොරතුරු ලේඛනය- **මුරාබහා සහ වීඑම්**

| | |
|---|---|
| විස්තරය හා නිපැයුමෙහි අරමුණ | **විස්තරය :**<br><br>මුරාබහා සහ වීඑම්<br><br>අරමුණ **:**<br><br>දේපළක් විකිණීම සම්බන්ධයෙන් දැනුම් දීමේදී, විකුණුම්කරු (PLC) භාණ්ඩය අත්පත් කර ගැනීමේදී දරන ලද සැබෑ පිරිවැය හෙළිදරව් කරන අතර ලබා ගන්නා ලාභය පිලිබඳ මිල දී ගන්නාට (සේවාලාභියාට) දැනුම් දිය යුතු ය.<br><br>කැපී පෙනෙන ලක්ෂණ:<br><br>*විකිණීම ට නියමිත වත්කම පැවතිය යුතු ය.<br><br>*විකිණුම් මිල නිශ්චය කල යුතු ය.<br><br>* කොන්දේසි විරහිත විකිණුමක් විය යුතු ය.<br><br>* මිලදී ගැනීම සඳහා ඇණවුම් කරන ලද මුරාබහා යනු වෙනත් පුද්ගලයෙකු හෝ ආයතනයක් හරහා භාණ්ඩ අත්පත් ගැනීමට උනන්දුවක් දක්වන පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලද, මිලදී ගැනීමට පූවර් පොරොන්දුවක් සහිත මුරාබහා වේ.<br>*මිලදී ගැනීමේ ඇණවුම් ගනුදෙනුව සඳහා මුරාබහාවකට සම්බන්ධ පාශර්ව තුනක් සිටිය යුතුය.<br><br>*මිලදී ගැනීම සඳහා ඇණවුම් කරන ලද මුරාබහා ගිවිසුමක් වෙන් වෙන් වශයෙන් විකුණුම් කොන්ත්‍රාත්තු දෙකකින් සමන්විත වේ. පළමු ගිවිසුම මිල ගැනුම්කරු සහ විකුණුම්කරු අතර වන අතර දෙවැන්න ගැනුම්කරු සහ මිලදී ගැනීම සඳහා ඇනවුම් කරන්නා අතර වේ. විකිණීමක් පාලනය කිරීම සම්බන්ධයෙන් අදාළ වන සියලුම නීති නිතැතින් ම මෙහි විකුණුම් ද්විත්වයටම අදාළ වේ. පළමු අලෙවිය සම්පූණර්යෙන්ම අවසන් වූ පසු දෙවන අලෙවිය සිදු කෙරේ.<br><br>අරමුණ **:**<br><br>*වෙළඳ භාණ්ඩ මිල දී ගැනීම<br><br>*වත්කම් මිල දී ගැනීම<br><br>*වෙළඳ අරමුණු සඳහා භාණ්ඩ මිල දී ගැනීම<br><br>*ලියාපදිංචි නොකළ වාහන<br><br>*ලියාපදිංචි වාහන<br><br>*යන්ත්‍ර සූත්‍ර |
| පාරිභෝගිකයන් සඳහා වන ප්‍රතිලාභ | * නම්‍යශීලී ආපසුගෙවීම්<br><br>* ඇප ප්‍රතිස්ථාපනය |
| ඉලක්ක වෙළඳපොල | *සමාගම්<br><br>*ව්‍යාපාරිකයින්<br><br>* තනිපුද්ගලයින් |

| | |
|---|---|
| ප්‍රධාන නියමයන් හා කොන්දේසි | (අ) ඔහුගේ / ඇයගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්.<br><br>(ආ) ආයතනයක් සම්බන්ධයෙන් වන විට, අධ්‍යක්ෂවරුන්ගේ ජාතික හැඳුනුම්පත්වල පිටපත්, සංගමයේ ව්‍යවස්ථා, 40, 41 හා 20 දරන ආකෘති පත්‍ර සහ IFSU හි මිලදී ගැනීම උදෙසා ඇණවුම් කිරීමේ පහසුකම සඳහා මුරබාහ් ඉල්ලා සිටීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අභියෝජනාව<br><br>(ඇ) පදිංචි ලිපිනය තහවුරු කිරීම සඳහා ලේඛනමය සාක්ෂි<br><br>(ඈ) සේවා නියුක්තිකයකු නම්, වැටුප් විස්තර, අඩු කිරීම්, ශුද්ධ වැටුප හා විශ්‍රාම දිනය තහවුරු කරමින් සේවා යෝජකයාගෙන් ලබා ගත් ලිපියක්.<br><br>(ඉ) ආදායම තහවුරු කිරීම සඳහා උපස්ථම්භක ලේඛන (බැංකු ප්‍රකාශ, විගණනය කළ හා කළමනාකරණ ගිණුම්).<br><br>(ඊබදු ගෙවන්නෙකු නම්, බදු ලිපිගොනු අංකය සහ පසුගිය අවුරුදු 3 ක ගෙවීම් ලදුපත්<br><br>(උ) භාරයක් සම්බන්ධයෙන් වන විට, ව්‍යවස්ථාවේ පිටපත් සහ IFSU හි මිලදී ගැනීම උදෙසා ඇණවුම් කිරීමේ පහසුකම සඳහා මුරබාහ් ඉල්ලා සිටීම වෙනුවෙන් කළමනාකරණ මණ්ඩලයේ අභියෝජනාව<br><br>(ඌ) නිසි පාරිභෝගික තොරතුරු (CDD) අවශ්‍යතා සම්පූර්ණ කිරීම |
| නෛතික ප්‍රතිපාදන | 1990 අංක 3 දරන පනත මගින් සංශෝධිත 1949 අංක 6 දරන උකස් පනත |
| අනුපාතය | පාරිභෝගික අවදානම් පැතිකඩ සහ 19.25 % - 30.00 % පරාසය මත පදනම් වන ලාභ අනුපාත |
| ගාස්තු හා අයකිරීම් | මුරාබහා වාහනය<br><br>* ලේඛන ගාස්තු (තැපැල්- රුපියල් 2000/-3750/-, ණය තොරතුරු කායර්‍ාංශය- රුපියල් 750/- 2,500/- ,පරීක්ෂණ- රුපියල් 3000/- 4500/-, මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ අතිරේකය රුපියල් 470)<br><br>* අදාළ වන්නේ නම් පමණක්, 0.1% ක මුද්දර ගාස්තු<br><br>* මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු - රජය විසින් පනවන ලද නියමිත ගාස්තු - අදාළ වන්නේ නම්<br><br>* වෙළඳ මුරාබහා රක්ෂණ ගාස්තු<br><br>* අදාළ දේපළ නිශ්චල දේපළක් වන්නේ නම්, උකස් ගාස්තු හා නෛතික ගාස්තු<br><br>* දේපළ පරීක්ෂණ ගාස්තු- රුපියල් 6000/- 23000/-<br><br>* ගෙවීම් පැහැර හැරීම් මත ගණනය කෙරෙන 24% වාෂරීක අඛණ්ඩ ගාස්තු |

- පාරිභෝගික පැමිණිලි සම්බන්ධ කටයුතු සඳහා කරුණාකර මෙම ලේඛනයෙහි අවසාන පිටුව වෙත යොමුවන්න.

**03.**මූලික තොරතුරු ලේඛනය- **මුශාරකාහ්**

| | |
|---|---|
| විස්තරය හා නිපැයුමෙහි අරමුණ | විස්තරය :<br><br>**මුශාරකාහ්** යනු ශරියාහ් නීතියට අනුකූල වන ව්‍යාපෘතියක මූල්‍ය හා කළමනාකරණය උදෙසා දායක වන පාශර්වයන් හවුල්කාරීත්වය මත පදනම් ව ලාභ සහ අලාභ බෙදාගැනීමේ ගිවිසුමකි. මෙය වත්කමක හෝ දේපලක හවුල් හිමිකාරිත්වයේ ආකාරයකි, හවුල් හිමිකාර වත්කම්වල හෝ දේපලවල අයිතිය සම්පූණර්යෙන්ම මිලදී ගන්නා හවුල් හිමිකරු වෙත පැවරෙන තෙක් ක්‍රමානුකූලව හවුල් හිමිකරුගේ කොටසක හිමිකාරිත්වය මිලදී ගැනීමට හවුල් හිමිකරුවන්ගෙන් කවරෙකු හෝ භාර ගන්නා/පොරොන්දු වේ.<br><br>අරමුණ:<br><br>* ලියාපදිංචි නොකළ වාහන, ලියාපදිංචි වාහන,<br><br>*යන්ත්‍ර සූත්‍ර<br><br>* කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව, නිවසක් / දේපළක් මිලදී ගැනීම |
| පාරිභෝගිකයන් සඳහා වන ප්‍රතිලාභ | * නම්‍යශීලී ආපසුගෙවීම්<br><br>*ලියාපදිංචි වාහන<br><br>*යන්ත්‍ර සූත්‍ර<br><br>*කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව<br><br>*නිවසක් / දේපළක් මිලදී ගැනීම |
| ඉලක්ක වෙළඳපොල | *සමාගම්<br><br>*ව්‍යාපාරිකයන්<br><br>* තනිපුද්ගලයින් |
| ප්‍රධාන නියමයන් හා කොන්දේසි | (අ)මුශාරකාහ් අයදුම්පත්‍රය- මෙය සේවාලාභියා විසින් සම්පූණර් කර ඔහු/අය විසින් අත්සන් කළ යුතු ය.<br><br>මෙම ලේඛනය IFSU හි සේවකයින් විසින් සම්පූණර් නොකෙරේ. .<br><br>(ආ) පාරිභෝගිකයාඅගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්.<br><br>(ඇ) සමාගමක් සම්බන්ධයෙන් වන විට, අධ්‍යක්ෂවරුන්ගේ ජාතික හැඳුනුම්පත්වල පිටපත්, සංගමයේ ව්‍යවස්ථා, 40, 41 හා 20 දරන ආකෘති පත්‍ර සහ IFSU හි මුශාරකාහ් පහසුකම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අභියෝජනාව<br><br>(ඈ) පදිංචි ලිපිනය තහවුරු කිරීම සඳහා ලේඛනමය සාක්ෂි.<br><br>(ඉ) වංචල දේපළ සම්බන්ධ ව මෑතක දී ලබා ගත් තක්සේරු වාතර්ාව.<br><br>(ඊ) සේවා නියුක්තිකයකු නම්, වැටුප් විස්තර, අඩු කිරීම්, ශුද්ධ වැටුප හා විශ්‍රාම දිනය තහවුරු කරමින් සේවා යෝජකයාගෙන් ලබා ගත් ලිපියක්.<br><br>(උ) ආදායම තහවුරු කිරීම සඳහා උපස්ථම්භක ලේඛන (බැංකු ප්‍රකාශ, විගණනය කළ හා කළමනාකරණ ගිණුම්).<br><br>(ඌ) බදු ගෙවන්නෙකු නම්, බදු ලිපිගොනු අංකය සහ පසුගිය අවුරුදු 3 ක ගෙවීම් ලදුපත් . |

| | |
|---|---|
| | (එ) සංගමයක් / සමාජයක් /සංසදයක් සම්බන්ධයෙන් වන විට IFSU හි මුශාරකාහ් පහසුකමක් ඉල්ලා සිටීම සඳහා ව්‍යවස්ථාවේ පිටපත් සහ කළමනාකරණ මණ්ඩලයේ අභියෝජනාව.<br><br>(ඒ) භාරයක් සම්බන්ධයෙන් වන විට, IFSU හි මුශාරකාහ් පහසුකමක් ඉල්ලා සිටීම සඳහා භාර ඔප්පුවේ පිටපත් සහ භාරකාර මණ්ඩලයේ/මහා භාරකරුගේ අභියෝජනාව<br><br>(ඔ) නිසි පාරිභෝගික තොරතුරු (CDD) අවශ්‍යතා සම්පූර්ණ කිරීම<br><br><br>නිවාස හා දේපල ලේඛන:<br><br>අ) අවම වශයෙන් වසර 25 ක හිමිකම් පරීක්ෂා කිරීම සඳහා ඇපය ලෙස පිරිනමනු ලබන දේපලෙහි හිමිකම් ඔප්පුවල මැනුම් සැලැස්ම සහ පිටපත<br><br>ආ) හිමිකම් ඔප්පුවේ පිටපත සමඟ පසුගිය වසර 25 සඳහා දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් ලබාගත් ඉඩම් ලියාඅදිංචි කිරීම් ලේඛනවල පත්ඉරු පිටපත්<br><br>ඇ) පළාත් පාලන ආයතනයෙන් ලබා ගන්නා පහත සඳහන් ලේඛන<br><br>- භාර නොගැනීමේ සහතිකය<br><br>- වීදි රේඛා/ ගොඩනැගිලි සීමාවන් පිළිබඳ සහතිකය<br><br>- අයිතිය පිළිබඳ සහතිකය<br><br>- දේපල සඳහා අනුපාත / ණය ගෙවන ලදුපත්<br><br>ඈ) මිලදී ගැනීමක් සඳහා නම්, දේපල විකිණීම සඳහා වත්මන් හිමිකරුගෙන් ලිපියක්, එකඟ වූ මිල, ගෙවන ලද අත්තිකාරම් මුදල, කොන්දේසි තිබේ නම්<br><br>ඉ) ඉදිකිරීමක් සඳහා නම්, ප්‍රමාණ බිල්පත/ අනුමත ගොඩනැගිලි සැලැස්ම |
| නෛතික ප්‍රතිපාදන | 1990 අංක 3 දරන පනත මගින් සංශෝධිත 1949 අංක 6 දරන උකස් පනත |
| අනුපාතිකය | පාරිභෝගික අවදානම් පැතිකඩ සහ 19.25% - 30.00 % දක්වා පරාසය මත පදනම් වන ලාභ අනුපාත |
| ගාස්තු හා වියදම් | *ලේඛන ගාස්තු (තැපැල්- රුපියල් 2000/-3750/-, ණය තොරතුරු කාර්යාංශය- රුපියල් 750/- 2,500/-,පරීක්ෂණ- රුපියල් 3000/- 4500/-, මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ අතිරේකය රුපියල් 470)<br><br>* 0.1% ක මුද්දර ගාස්තු<br><br>* මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු - රජය විසින් පනවන ලද නියමිත ගාස්තු<br><br>*රක්ෂණ ගාස්තු<br><br>* පහසුකමෙහි වටිනාකම මත සේවා ගාස්තුවක් / මෙහෙයුම් ගාස්තුවක් අය කෙරෙනු ඇත. -රුපියල්2000-10000<br><br>* වාහන පරීක්ෂණ ගාස්තු- රුපියල් 6000/- 23000/-<br><br>* උකස් ඔප්පුව ලියාපදිංචි කිරීමේ ගාස්තු<br><br>• ගෙවීම් පැහැර හැරීම් මත ගණනය කෙරෙන 24% වාර්ෂික අඛණ්ඩ ගාස්තු |

- පාරිභෝගික පැමිණිලි සම්බන්ධ කටයුතු සඳහා කරුණාකර මෙම ලේඛනයෙහි අවසාන පිටුව වෙත යොමුවන්න.

## **04.**මූලික තොරතුරු ලේඛනය – පීඑල්සී වාදි'ආහ් (ඉස්ලාමීය රන් සුරකුම්)

| | |
|---|---|
| නිපැයුමෙහි විස්තරය හා අරමුණ | ඔබගේ මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් කඩිනම් හා පහසු විසඳුමක් ලෙස ඔබගේ රන් සුරකුම් තැන්පත් සහතිකය සඳහා පීඑල්සී වාදි'ආහ් රන් සුරකුම් තැන්පතුවක් ඉල්ලුම් කිරීම මඟින් ඒ සඳහා උපරිම වටිනාකමක් ලබා ගත හැක.<br><br>අරමුණ:<br><br>හදිසි මූල්‍ය අවශ්‍යතා සඳහා මූල්‍ය විසඳුම් සැපයීම |
| පාරිභෝගිකයන් සඳහා වන ප්‍රතිලාභ | - ඉස්ලාමීය රන් නිෂ්පාදන වෙළඳපොලේ පීඑල්සී වාදි'ආහ් හි අඩුම අපේක්ෂිත මිල ගණන් යටතේ රන් සුරකුම් තැන්පත් සහතිකය සඳහා ඉහළම මුදල් අත්තිකාරම් සුරක්ෂිතව තබා ගැනීමේ ගාස්තු<br><br>- කිසිදු සැඟවුණු/අමතර ගාස්තුවක් නොමැත. අත්තිකාරම් සහ සුරකුම් තැන්පත් ගාස්තු ඔබේ අභිමතය පරිදි පහසු වාරිකවලින් පියවීමට හැකියාව ඇත<br><br>- රන් සුරකුම් තැන්පත් පහසුකම් කාලසීමාව දින 10/ දින 30/ දින 60/ දින 90/ දින 180/ දින 365<br><br>- රන් භාණ්ඩ සඳහා වකුගුල් රක්ෂණය නොමිලේ.<br><br>- කාලසීමාව අවසානයේ අවම මුදලක් ගෙවීම මඟින් සුරැක් කාලසීමාව දීසර් කරගැනීම<br><br>- ඔබට අප ආයතනය සමඟ පහසුකම් කිහිපයක් ඇති විට තනි භාන්ඩයක් නිදහස් කර ගැනීමේ හැකියාව<br><br>- මනා පුහුණුවක් සහිත, අත්දැකීම් බහුල හා මිත්‍රශීලී කාර්‍ය මණ්ඩලයක් විසින් ඔබට සේවය ලබාදෙයි.<br><br>- කල්පිරීමේ දිනයට ප්‍රථම කෙටි පණිවිඩ නිවේදන |
| ඉලක්ක වෙළඳපොල | මෙම සේවාව ස්වර්ණාභරණ නිෂ්පාදකයින්, ස්වර්ණාභරණ වෙළඳසැල් හිමියන් සහ ව්‍යාපාරිකයන්ගෙන් සමන්විත ආයෝජන සහ සිල්ලර පාරිභෝගික කාණ්ඩ සඳහා නිමර්ාණය කර ඇත. |
| ප්‍රධාන නියමයන් හා කොන්දේසි | - භාණ්ඩයේ රන් මිශ්‍රණය කැරට් 16 ට හෝ 67% ශුද්ධතාවයකට අඩු නොවිය යුතුය. රන් කාසි, රන් බිස්කට්, රන් කැට, "කැටි" හෝ "මුස් කළ රත්තරන්" ද නිසැකවම හා අනිවාර්යයෙන් පිළිගත හැකිය<br><br>- වාදි'ආහ් සුරකුම් තැන්පත් අයදුම්පත්‍රය හා රන් පහසුකම් උකස් ඔප්පුව<br><br>- ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් |
| නෛතික ප්‍රතිපාදන | 1990 අංක 3 දරන පනත මගින් සංශෝධිත 1949 අංක 6 දරන උකස් පනත |
| අයකිරීම් | පාරිභෝගික අවදානම් පැතිකඩ සහ 11.00% - 16.50 % දක්වා පරාසය මත පදනම් වන සුරකුම් තැන්පත් අයකිරීම් |

# පැමිණිලි කළමනාකරණය කිරීමේ ක්‍රියා පටිපාටිය:

■ පාරිභෝගිකයින්ට පහත ආකාරවලින් පැමිණිලි කල හැකිය.
■ අදාළ ශාඛා කළමනාකරු හරහා
■ පාරිභෝගික සේවා සහ ආරවුල් විසඳීමේ දෙපාර්තමේන්තුව, අංක 1161, මරදාන පාර, කොළඹ 08 වෙත පාරිභෝගිකයෙකුට සම්පූර්ණ විස්තර ඇතුළත් පුද්ගලික පැමිණිල්ලක් ලිඛිතව ප්‍රධාන කාර්යාලයේ වැඩ කරන වේලාවන් තුළ ඉදිරිපත් කළ හැකිය.
■ විද්‍යුත් තැපෑල: customervices@plc.lk
■ ඇමතුම් මධ්‍යස්ථානය හරහා (0112206300)
ලියන්න: පාරිභෝගික සේවා සහ ආරවුල් විසඳීමේ දෙපාර්තමේන්තුව, අංක 1161, මරදාන පාර, කොළඹ 08.
■ පහත සබැඳිය/මාර්ගය හරහා ඉදිරිපත් කිරීමේ පෝරමය බාගන්න

https://www.plc.lk/wp-content/uploads/2023/02/Customer-Complaint-Grievance-Handling-Form.pdf

www.plc.lk ---> ඉක්මන් සබැඳි ----> පාර්ශවකරුවන්ගේ ප්‍රතිපෝෂණ ----> පැමිණිලි සහ දුක්ගැනවිලි ----> පැමිණිලි සහ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමේ පෝරමය (බාගත කරන්න)

මූල්‍ය සමාගම විසින් සතුටුදායක විසඳුමක් ලබා නොදෙන්නේ නම්, පාරිභෝගිකයාට පහත සඳහන් බාහිර ආරවුල් විසඳීමේ යෝජනා ක්‍රම වෙත පිවිසිය හැකියි.

**මූල්‍ය පාරිභෝගික සම්බන්ධතා දෙපාර්තමේන්තුව**

අධ්‍යක්ෂ

මූල්‍ය පාරිභෝගික සම්බන්ධතා දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30,
ජනාධිපති මාවත,
කොළඹ 01.

දුරකථන: 011 247 7966
ක්ෂණික ඇමතුම් : 1935
ෆැක්ස් : +94 11 247 7744
විද්‍යුත් තැපෑල: fcrd@cbsl.lk
වෙබ්: https://www.cbsl.gov.lk/en/fcrd

**මූල්‍ය ඔම්බුඩ්ස්මන්**

මූල්‍ය ඔම්බුඩ්ස්මන්

143 වජිර පාර
කොළඹ 05.
දුරකථන: 011 259 5624

ෆැක්ස්: (+94)11 259 5625
විද්‍යුත් තැපෑල: fosril@sltnet.lk

වෙබ් අඩවිය: www.financialombudsman.lk